www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉහල වර්ධනයකින් පසුව ලෝක ආර්ථිකය "සන්ධිස්ථානයක"

## After strong growth, world economy at a "turning point"

**නික් බීම්ස් විසිනි**
**2007 අප්‍රේල් 24**

ලෝක ආර්ථිකයේ තත්වය පිලිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) හා ලෝක බැංකුව මෑතකදී පලකල වාර්තාවලින්, දශක හතරක කාලයක් තුල දක්නට නොලැබුනු තරමේ ගෝලීය උත්පාතයක දර්ශනයක් සිතුවම් කරයි.

මේ මස මුල දී පලකල ජාමූඅ ලෝක ආර්ථික දැක්ම (ඩබ්ලිව්ඊඕ) පුරෝකථනය කරන්නේ, 2003-2006 අතර කාලයේ පැවති සාමාන්‍ය ලෝක වර්ධන අනුපාතය වූ සියයට 4.9, අවම වසයෙන් ඉදිරි දෙවසර තුල ද එලෙස ම පවතිනු ඇති බවයි. ජාමූඅ ගනන් හිලව් අනුව මීට වඩා වේගවත් නැගීමක් ඇතිවූයේ, සාමාන්‍ය ලෝක වර්ධනය සියයට 5.4ක් සලකුනු කල 1970-73 අතර කාලයේ පමනි. වර්තමාන අනුපාතය තිරසාර ලෙස පවතින්නේ නම් එය සලකුනු කරනු ඇත්තේ 1970 පටන් ලෝක ආර්ථික ප්‍රසාරනයේ බලගතු ම සය වසරක කාලය මෙය ලෙසය.

2006 දෙසැම්බර් මස ලෝක බැංකුව විසින් පල කරන ලද 'ගෝලීය ආර්ථික අපේක්ෂාවන්' පිලිබඳ වාර්තාවේ නිගමන සාරභූත ලෙස ම ඊට වෙනස් නොවේ. මැනීම් තාක්ෂනයේ වෙනස්කම් හේතුවෙන් එහි සංඛ්‍යා ජාමූඅ වඩා සුලුවසයෙන් පහත බැස ඇත ද, ලෝක බැංකුව පෙන්වා දෙන්නේ "දියුනු ආර්ථිකයන් මෙන් දෙගුනයක වේගයෙන් වර්ධනය වූ දියුනුවන රටවල වේගවත් ප්‍රසාරනය" "ශක්තිමත් ගෝලීය කාර්යසාධනයක්" පිලිබිඹු කරන බවයි. මෙය හුදෙක්, සියයට 10.4කින් වර්ධනය වූ චීන ආර්ථිකයේ බලපෑමෙහි ප්‍රතිඵලයක් නොව, දියුනුවන රටවල පරාසය හරහා පැතිර ගිය එකකි. කැටිකරගත් කල ගෝලීය නිමැවුමේ වර්ධනයෙන් සියයට 38ක් මෙම කලාපයන් තුල හටගත් අතර එය ලෝක දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 22ක් වූ ඔවුන්ගේ පංගුවට වඩා වැඩි ය.

පසු ගිය විසිපස් වසර, 1980-2000 හා 2000-2005 වසයෙන් කාල වකවානු දෙකකට වෙන්කලේ නම්, දියුනුවන රටවල සාමාන්‍ය වර්ධනය පලමු කොටසේ දී සියයට 3.2ක සිට දෙවන කොටසේ දී සියයට 5ක් දක්වා ඉහල නැග ඇති බව ලෝක බැංකුව සටහන් කරයි. මෙම නැගීම සියලු රටවල් විසින් බෙදා හදා නොගත්ත ද, ඉන් එකක්වත් හුදෙක් චීනයේ හා ඉන්දියාවේ වැඩිවූ වර්ධනයේ ප්‍රතිඵලය නොවී ය.

ජාමූඅ ලෝක ආර්ථික දැක්ම ද, ආර්ථික සාර්ථකත්වයන් පිලිබඳ මෙවන් වාර්තාවලින් පිරී පවතී. යුරෝ කලාපයේ දදේනි, 2005 අනුපාතය මෙන් දෙගුනයක් තරම් ද, 2000න් පසු ඉහල ම අගය ද වූ සියයට 2.6 කරා ලඟාවෙමින් 2006 දී බටහිර යුරෝපා ආර්ථික ක්‍රියාකාරකම්වල "ජවය ගොනු කරගෙන" ඇත. මෑත වසරවල ප්‍රධාන කොට ම ව්‍යාපාරයන්හි සෞඛ්‍යයේ හා තරගකාරිත්වයේ වැඩිදියුනුව මගින් ජනනය කල ශක්තිමත් ආයෝජනයේ අපනයන වර්ධනයේ නැගීම මගින් දහනය කල ප්‍රධාන එංජිම වූයේ ජර්මනිය" යයි එය කියා සිටියි. යුරෝ කලාපයේ මුලු විරැකියා අනුපාතය වසර 15කට පසුව එහි පහත්ම මට්ටම වූ සියයට 7.6 ක් දක්වා අඩු වී ඇත.

මීටත් වඩා හොඳ ප්‍රවෘත්ති ජපානයෙන් අසන්නට ලැබේ. 1990 ගනන් මුලදී, කොටස් වෙලඳපොලේ හා නිශ්චල දේපල පිම්බූ බුබුල පිපිරී යාමෙන් පසුව දශකයකට වැඩි කලක් තිස්සේ එරට ආර්ථිකය මුලුමනින්ම පාහේ එකතැන පල්වෙමින් තිබුනි. 2006 මැද භාගය තුල පාරිභෝජනයේ අනපේක්ෂිත පහල වැටීමක් තිබියදීත් "ආර්ථිකයේ යටින් පැවති ගතිකය, ඉහල ලාභ, වැඩි වර්ධනය වූ ව්‍යාපාර ශේෂපත්‍රයන් හා බැංකු නය යලි පනගැන්වීමෙන් උත්තේජනය කල පෞද්ගලික ආයෝජනයේ ප්‍රසාරනයන්, ඉහල යන අපනයන වර්ධනයත් සමග ස්ථාවර වී ඇති" අතර ජපානයේ සඵල ආර්ථික වර්ධනය සියයට 2කට වඩා ඉහලින් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2006 දී සියයට 5.5ක් වූ ලතින් ඇමරිකාවේ වර්ධන අනුපාතය මෙම වසරේ දී සියයට 4.9ක් කරා පහත වැටේ යයි අපේක්ෂා කල ද, 2004-2006 දක්වා වූ අවුරුදු "1970න් පසු ලතින් ඇමරිකානු වර්ධනයේ ප්‍රබලතම තෙවසරක කාලය" විය.

"චීනය හා ඉන්දියාව යන දෙරටේ ප්‍රබල වර්ධනය" මගින් උත්තේජනය කල ඊනියා "පිබිදෙන ආසියාවේ" ආර්ථික ක්‍රියාකාරිත්වය "යුහුසුලුව ප්‍රසාරනය වෙමින් පවතී." ඉහල ගිය පාරිභෝජනය, ආයෝජනය

හා අපනයනයන්ගේ ප්‍රතිඵල වසයෙන් චීනයේ සඵල දළ දේශීය නිෂ්පාදිතය 2006 වසරේදී සියයට 10.7කින් ප්‍රසාරනය වූ අතර ඉන්දියාවේ වර්ධන අනුපාතය සියයට 9.2ක් විය.

නැගෙනහිර යුරෝපයේ වර්ධනය 2006 වසරේ දී සියයට 6ක් දක්වා ඉහල නැගි අතර එම වසරේ ම රුසියාවේ වර්ධන අනුපාතය සියයට 7.7ක් විය. එය 2007 දී සියයට 7ක් හා 2008 දී සියයට 6.4ක් දක්වා පමනක් සුලු වසයෙන් පහත වැටෙතැයි අපේක්ෂිත ය.

ප්‍රබල ගෝලීය වර්ධනයක වාතාවරනය තුල ඉහල නැගි ප්‍රාග්ධන ගලා ඒම් රටවල් ගනනාවක් තුල තෙල් නිෂ්පාදනය වැඩි වීම හා ඉන්ධන භාවිතයෙන් තොර භාන්ඩ ඉල්ලුම වැඩිවීම යනාදී වසයෙන් අප්‍රිකාවේ ආර්ථික දසුන "ඉතා සාධනීය" බව වාර්තාවෙන් විස්තර කෙරේ. "සඵල දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 2006 දී සියයට 5.5ක සිට මෙම වසර තුල සියයට 6.2 දක්වා ඉහල යනු ඇතැයි ද 2008 දී එය සියයට 5.8ක් දක්වා පහත වැටෙතැයි ද අපේක්ෂා කෙරේ.

ඒ සමග ම අවධානයට යොමු වන එක් ක්ෂේත්‍රයක් වූයේ, නිවාස වෙලඳපොලෙහි සැලකිය යුතු පහල වැටීම හේතු කොට ගෙන එක්සත් ජනපද ආර්ථිකය මන්දගාමී වීම මගින් අවශේෂ ලෝකයේ ප්‍රසාරනය ආපසු ඇදී යා හැකිද යන කාරනය යි. නවතම සංඛ්‍යා ලේඛන පෙන්නුම් කරන්නේ නිවාස ඉදිකිරීමේ හා බලපත්‍ර නිකුත් කිරීම් තවමත් පහලට යොමු වී ඇති බවත්, නොවිකුනූ නිවාස ප්‍රමානය වසර 15ක් තුල එහි ඉහලම මට්ටම්වලට ලඟා වී ඇති බවත් ය. 2006 වසරේ අවසන් තුන් කාර්තුවෙහි නිවහන් ඉදිකිරීමේ තියුනු හැකිලී යාම එක්සත් ජනපද දළ දේශීය සඵල වර්ධනයෙන් සියයට, එකක සාමාන්‍ය අගයක් ගත් බව ගනන් බලා තිබේ.

එක්සත් ජනපද ආර්ථිකය පසු ගිය වසර පුරා "කැපීපෙනෙන පරිදි මන්දගාමී වීමේ" තත්වය තුල, ජාමූඅ උත්සුක වන ප්‍රධාන කාරනය වූයේ "වර්ධනයේ මෙම දුබලතාවය තාවකාලික මන්දගාමී වීමක් ද නොඑසේ නම් වඩා දිග් ගැස්සුනු පහත වැටීමක ආරම්භක අදියර ද" යන්න පිලිබඳව ය. වර්ධනයේ ඇන හිටීම තවමත් දක්නට ලැබෙන්නේ පහතවැටීමකට වඩා මෙම අදියරේ දී බොහෝ විට සිදුවිය හැක්කක් ලෙසිනි" යයි එය සමාප්ත කෙරේ. පසුගිය සැප්තැම්බරයේ දී ගනන්බැලූ සියයට 2.9 හා සැසඳීමේ දී දුන් එක්සත් ජනපදයේ වර්ධනය පිලිබඳ අනාවැකිය සියයට 2.2 දක්වා පහතට දමා තිබුන ද ආර්ථික ප්‍රසාරනය "2007 වසර තුල කාර්තු අනුව ගනන් බැලූ වර්ධන අනුපාතිකයන්ගේ ඉහල යෑම හා 2008 මැද භාගය වන විට විභව්‍ය තැනකට යලි පත්වීමත් සමග අනුක්‍රමයෙන් ජවය ලබා ගනු ඇතැයි විශ්වාස කෙරේ."

## මූල්‍ය අස්ථාවරත්වය

එක් ප්‍රකට අර්ථශාස්ත්‍රඥයකු කියා සිටි පරිදි " ගෝලීය ආර්ථිකය පිලිබඳව මා කවර දිනක හෝ දැක ඇති එක් වඩාත්ම ශුභවාදී නිල අනාවැකිය" ගෙනහැර දක්වන අතර ම ජාමූඅ වාර්තාව, විශේෂයෙන්ම මූල්‍ය වෙලඳපලවල් පිලිබඳව තරමක් කනස්සලු සහගත හඬක් නගයි.

ඉහල ප්‍රතිලාභ සඳහා නොනැවතී සිදුවන ධාවනයේ ප්‍රතිලාභය වී ඇත්තේ මනා වැටහීමක් නොමැති වෙලඳපලවල් හා මූල්‍ය උපකරන මත ඉහල අවදානමක් ගැනීමට සිදුවීමයි. "වෙලඳපල නම්‍යශීලීව පවතින තාක් මෙම මූලෝපාය සාර්ථක විය හැකි වුවත් මිල පහත වැටීම්, වැඩිවන අස්ථායිතාවය හා නය ගැනීමේ පාඩු ඇතිවීම ආයෝජන මූලෝපායන් එකට එක කිරීමේ තැනකට යොමු විය හැකි අතර ඕනෑවට වඩා ඇදී ගිය තත්වයන්ගෙන් ඉවත්ව යෑමක් ද සිදුවිය හැක. එවන් ලිහීයාමක් බැරෑරුම් සාර්වආර්ථික ප්‍රතිඵල ජනිත කලහැකි" බවත් එහි සඳහන් වේ.

පෞද්ගලික ව්‍යාපාරවස්තු සමාගම්වල මූලිකත්වයෙන් නිතරම පාහේ උත්තාරලන වාසි සඳහා කෙරෙන කොටස් මිලට ගැනීම්වල මෑතක සිදු වූ ඉහල නැගීම පිලිබඳව අනතුරු ඇඟවීමක් වාර්තාව තුලින් අසන්නට ලැබුන ද අවසානයේ දී ගෝලීය වර්ධනයේ අවදානම්වල "සයමසකට පෙර තිබුනාට වඩා දැන් තුලනතාවක් දක්නට ලැබෙන" බව පවසයි.

ජාමූඅ හා ලෝක බැංකුව සැලකියයුතු විශ්ලේෂනයක් සම්පාදනය නොකරම පෙන්වාදී ඇත්තේ ලෝක ආර්ථිකයේ ඉහලට යොමු වීම පිටුපස ඇති ප්‍රධාන සාධක වන්නේ ගෝලීය වෙලඳපොලවල ඒකාබද්ධවීම් චීන හා ඉන්දීය ආර්ථිකයන් විවෘතවීම ලෝක ශ්‍රම සැපයුමේ ප්‍රසාරනය හා සන්නිවේදන හා තොරතුරු තාක්ෂනයේ බලපෑම බවයි.

ලෝක බැංකුවට අනුව, පසු ගිය විසිපස් වසර පුරා සිදුවී ඇති ගෝලීය ආර්ථිකයේ පෙර නොවූ විරූ ඒකාබද්ධවීම්, සන්නිවේදන හා ප්‍රවාහන පිරිවැයේ තියුනු පහල වැටීමත් සමග එක්ව වෙලඳාමේ බාධක අඩු වී යාම, නැගී එන වෙලඳපොලවල් ගෝලීය වෙලඳපෙලෙට ඒකාබද්ධ වීම සමග බැඳී ගත් පලදායිතාවේ වැඩිවීම ට මග පාදා ඇත.

"1960 ගනන්වල මුල පටන් ලෝක වෙලඳාම පුපුරා හැලුනි. ලෝක අපනයනයන් (2000 වසරේ ඩොලර් වටිනාකම අනුව) වසරකට යන්තම් ඩොලර් ට්‍රිලියනයක සිට වසරකට ට්‍රිලියන 10කට ආසන්නව වසරකට සියයට 5.5ක වාර්ෂික අනුපාතයකින් වර්ධනය විය. එම කාලය තුල ම සියයට 3.1කින් වර්ධනය වූ ගෝලීය නිෂ්පාදිතය එමගින් පැහැදිලි ලෙසම ඉක්මවා ගියේය. 1970ත් 2004ත් අතර ගෝලීය නිෂ්පාදිතයට

සාපේක්ෂව අපනයනවල පංගුව දෙගුනයකටත් වඩා වැඩි වූ අතර දැන් එය සියයට 25 ඉක්මවා ඇත. මෙම වකවානුවේ මුල් භාගය පුරාම අපනයන නම්‍යශීලීත්වය (නිමැවුමට සාපේක්ෂව අපනයන වර්ධන අනුපාතය) පැවතුනේ 1:5 ලෙස ය. එහෙත් 1986 පමන වන විට නම්‍යශීලීත්වය සැලකියයුතු ලෙස ඉහල ගිය අතර දශකයකට පසුව එහි මුදුනටම ලඟා වූයේ එය 2:5 ක් බවට පත්වෙමින් ය. වෙගවත් වීම ආරම්භ වූයේ යකඩ තිරය බිඳ වැටීමටත්, චීනය හා ඉන්දියාව සිය ආර්ථිකයන් විවෘත කරමින් අපනයන ප්‍රමුඛකොට ගත් මූලෝපායක් අනුගමනය කිරීමත් පසුපසිනි."

ශ්‍රමයේ භූගෝලීය කරනයට කැප කල විශේෂ අංශයකදී ජාමූඅ වාර්තාව ගනන් බලන්නේ, "සංවර්ධිත රටවල්, නිමි භාන්ඩ අපනයනය ද, අතරමැදි භාන්ඩ නිෂ්පාදනය (අර්ධ නිමි භාන්ඩ) රටින් බැහැරට ගෙන යමින් ද සංක්‍රමනයන් ද වැනි විවිධ නාලිකාවන් හරහා වර්ධනය වන ගෝලීය ශ්‍රම තටාකය වෙත පිවිස තිබේ." යයි සඳහන් කරමිනි.

ශ්‍රම සැපයුම් ඉහල යෑම වැඩිකොටම සිදු වූයේ 1990න් පසුව නැගෙනහිර ආසියාව ඉන් අඩකටම දායක වීමත් දකුනු ආසියාව ද පැරනි නැගෙනහිර කඳවුරේ රටවල් සුලු ප්‍රමානයන්ගෙන් දායක වීමත් සමග ය. ලාභ ශ්‍රමයේ වැඩි කොටසක් සැදුම්ලන්නේ අඩු අධ්‍යාපනයක් සහිත කම්කරුවන්ගෙනි. වාර්තාව සඳහන් කරන පරිදි සාපේක්ෂව ඉහල අධ්‍යාපනයක් සහිත කම්කරුවන්ගේ සැපයුම පසු ගිය වසර 25 තුල සියයට 50න් ඉහල ගිය අතර එහි දායකත්වය ප්‍රධාන වසයෙන් ම දියුනු රටවලින් පමනක් නොව චීනයෙන් ද සැපයුනි.

ලෝක බැංකුව හෝ ජාමූඅ කිසිදු ඓතිහාසික සමාන්තරයන් ඇඳ දැක්වීමට අසමත් වන්නේ වුව ද, ධනේශ්වර භූගෝලීය කරනයේ නවතම අදියර සමග සම්බන්ධ වූ පුලුල් ව්‍යූහාත්මක වෙනස්කම් සිහියට නගන්නේ 20 වන සියවස ආරම්භයේ දී ප්‍රධාන ධනේශ්වර රටවල් තුල ලාභානුපාතිකයන්ගේ හා ආර්ථිකයේ වර්ධනය සැලකියයුතු ප්‍රවේශයක් අත් කර ගත්තේ යටත්විජිතයන්ගෙන් ලබා ගත් ලාභ අමුද්‍රව්‍ය, ඛනිජ හා අනෙකුත් සම්පත් මත බවය.

නව තාක්ෂනය සමග ඒකාබද්ධව පසු ගිය දශක දෙක තුල ගෝලීය ශ්‍රම හමුදාවේ ඇති වූ පුලුල් ප්‍රසාරනයේ ප්‍රතිඵලය වී ඇත්තේ ලාභයේ සැලකියයුතු පිම්බීමකි. 1980 ගනන් ආරම්භයේ පටන් දියුනු ධනේශ්වර රටවල දල දේශීය නිෂ්පාදිතයෙන් ශ්‍රමයට හිමි පංගුව සියයට 8කින් පහත වැටී ඇති බව ගනන් බලා ඇත. සංවිධාන දෙක විසින් ම සලකනු ලබන්නේ වර්ධනයේ නවතම ඉහල නැගීම ලෝක ධනවාදයේ සෞඛ්‍යයෙහි හා ස්ථාවරත්වයේ සලකුනක් ලෙසිනි. එහෙත් කනස්සලු සහගත සංශයන්ද නැත්තේ නොවේ. ලෝක බැංකුවේ ම වචනවලින් කිවහොත් "වඩාත් පිලිගැනීමට ලක් වන්නේ මෙම සුවදායක පසුබිම වුවත්, වසර ගනනාවක් පැවති ඉතා ප්‍රබල වර්ධනයෙන් පසුව ගෝලීය ආර්ථිකය සන්ධිස්ථානයකට පැමින තිබේ. එවන් අවධීන් ඇතිවන්නේ අවදානමක් ද සහිතවය. සැබැවින්ම ඒ හා සමානවූ ශුභවාදී අවස්ථාවන් යටතේ ආරම්භ වූ පසුගිය සියවස ද අංගලක්ෂිත වූයේ තාක්ෂනික වෙනස්කම් හා සුලභ ද්‍රවශීලතාවය මගින් දිරිමත් කල ප්‍රබල වර්ධනයේ දිග් ගැස්සුනු අවධියකිනි. එහෙත් එවක සිටි ප්‍රමුඛ අර්ථශාස්ත්‍රඥයන් අපේක්ෂා කල පරිදි එය ඉදිරියට පැවතීගෙන යනවා වෙනුවට ලෝකය කඩා වැටුනේ මහා අවපාතයකට ය. එබැවින් වත්මන් වාතාවරනය බෙහෙවින් විශ්වාස කටයුතු වුවත් ප්‍රවේශම් වීම යෝග්‍ය බව කිව යුතු ය."

එමෙන්ම මහා අවපාතයට පෙර ප්‍රථම ලෝක සංග්‍රාමය ද 1917 රුසියානු විප්ලවය ද 1920 ගනන් මුල යුරෝපයම අලලා ගත් විප්ලවකාරී කැලඹීම් ද දක්නට ලැබුනි. 19 වන සියවස අවසානයේ හා 20 වන සියවස මුල ලෝක ආර්ථිකයේ ඇති වූ කැලඹීම් සහගත වර්ධනය ද ජර්මනිය, ජපානය හා එක්සත් ජනපදය වැනි නව බලයන් නැගී ඒමත් සමග 19වැනි සියවසේ පැරනි සමතුලිතය බිඳී ගියේ යුද්ධයට දොර හරිමිනි. ලෝක ධනවාදී ආර්ථිකයේ මෙම ප්‍රසාරනය මගින් ජාත්‍යන්තර කම්කරු පන්තියේ වර්ධනය ද උදා කල අතර ඉන් සලකුනු කෙරෙන්නේ මහජනතාවන් දේශපාලන අරගලයන් වෙත එලඹීම යි. සැබවින්ම ඉතිහාසය පුනර්කරනය නොවේ. එහෙත් ලෝක ධනවාදයේ එම ව්‍යූහය තුල ම සිදුවෙමින් පවතින හා ආර්ථික වර්ධනයේ සංඛ්‍යාලේඛන තුල පිලිබිඹු වන දැවැන්ත වෙනස්කම් දේශපාලන විෂය පථයන් කෙරෙහි දුරදිග යන බලපෑමක් ඇති කරන බව ඓතිහාසික වාර්තාව පිරික්සා බැලීමේ දී ඇඟවුම් කෙරේ.

© www.wsws.org